# කතුවැකිය

**තුසිත මලලසේකර**

**මෙය එක් මිනිසෙකු තැබූ පියවරක් නොව**
**මානව සංහතිය පනිනු ලැබූ යෝධ පිම්මකි.**
**-නීල් ආම්ස්ට්‍රෝන්ග්**
**සඳ මතුපිටදී 1969 ජූලි 20**

වලාකුළු රහිත රැයකදී අහස්කුස දෙස නෙත් යොමන්න. නිවෙමින් දිලිසෙමින් පවතින ලක්ෂ සංඛ්‍යාත තාරකා ඔබව විශ්මයට පත්කළ හැකිය. එසේ අප දකින තාරකා (සූර්යයන්) සහ ග්‍රහලෝක වායුගෝල අතර පවත්නා හිස් ප්‍රදේශය හැඳින්වෙන්නේ අභ්‍යවකාශය ලෙසය. ඉඳහිට හමුවන පාෂාණ කැබැල්ලක් හැරුණු විට මුළු අභ්‍යවකාශයම පුරා විසිර ඇත්තේ ඉතා තුනී දූලි හා වායු ස්වල්පයක් පමණක් විය හැකිය.

අභ්‍යවකාශය අඳුරුය. ඒ ආලෝකයට පරාවර්තනය කළ හැකි කිසිවක් එහි නොමැති නිසාය. අභ්‍යවකාශය ඇරඹෙන්නේ අහවල් මායිමේ සිට යැයි කිව නොහැක්කේ පෘථිවි වායුගෝලය එක්වර සිඳී නොයන බැවින්ය. නැතහොත් වැටක හෝ තාප්පයක හෝ රැකවරණය නොලබන බැවිනි. වායුගෝලය තුනී වී යන්නේය. අභ්‍යවකාශය එතැනින් ඇරඹෙන්නේය. පොළෝ තලයේ සිට කිලෝමීටර් 100 ක් ගෙවුන තැන සිට අභ්‍යවකාශය ඇරඹේ යයි දළ වශයෙන් අපට අනුමාන කළ හැකිය. එහෙත් එය නිමාවන්නේ කොතැනදීද යැයි පිළිබඳ එසේ ඉඟියක් දිය නොහැක. අභ්‍යවකාශය අපූර්ව ස්ථානයකි. එහි සමහර තැනකදී මිනිස් අපව ඉඳිආප්ප රැලක් සේ ඇදීයා හැක. නැතිනම් බිත්තරයක් මෙන් තැම්බීමට ලක්කිරීමට පුළුවන. හිම කැටයක් සේ ඝන බවට පත් කළ හැකි තැන්ද නැත්තේ නොවේ.

අභ්‍යවකාශයේ වාතය නොමැතිය. එනිසා එහිදී අපට මෙහේදී මෙන් හුස්ම ගත නොහැක. අප මහ හඬින් විලාපදුන්නද ඒ හඬ පැතිර නොයන්නේ අසන්නට එහි කිසිවකු නොමැති නිසා පමණක් නොව ඒ හඬ ගෙනයාමට ද මාධ්‍යයක් නොමැති නිසාය. අභ්‍යවකාශයෙහි ගුරුත්ව බලයක්ද නොමැත්තේය. එහි ගියහොත් පාවෙමින් සිටින්නට වන්නේ එහෙයිනි.

අභ්‍යවකාශය අබිරහස් ගුලාවකි. එසේම එය අසීමිත ලෙස විනෝදාශ්වාදයට හා ඵලප්‍රයෝජන ලබාගත හැකි සම්පතකි. එනිසාම අපගේ සෞරග්‍රහ මණ්ඩලයෙන් ඇරඹී, අභ්‍යවකාශය හරහා විශ්වය ගවේෂණයට මිනිසා පිඹුරුපත් සකස් කළේ අදක ඊයෙක නොවේ. දැන් මෙම ගවේෂණ හෝඩි පොත කියවා හමාර තරම්ය.

මිනිසාගේ වර්තමාන උත්සහය නම් අභ්‍යාවකාශයෙන් ලද හැකි ඵල ප්‍රයෝජන මිනිසාගේ පැවැත්මට (හා නොපැවැත්මට) යොදා ගැනීමය. අභ්‍යවකාශ යානා මත ගල්වන තාපස්ථායී තීන්තවල සිට අභ්‍යවකාශගාමීන්ගේ මෙවලම් බහාලන සාක්කු රැසක් සහිත කලිසම් දක්වා දැන් පොළොව මතුපිට වෙසෙන අපගේ පරිහරණයට එක්වී හමාරය. එබැවින් මෙවර විදුරාව සඟරාව අභ්‍යවකාශ තාක්ෂණය තේමා කරගනිමින් එහි අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳ මෙන්ම අභ්‍යවකාශ තාක්ෂණය අපට උරුම කර දී ඇති විවිධ යන්ත්‍රසූත්‍ර, මෙවලම්, උපක්‍රම, ඖෂධ ආදී අතුරු ප්‍රතිඵල පිළිබඳව වන දැනුම් සම්භාරය පිළිබඳවද කතාබහක යෙදෙයි.

1969 ජූලි විසිවන දින නීල් ආම්ස්ට්‍රෝන්ග් පැවසූ මහා පිම්ම තවමත් අවසන් වී නොමැත.